**බදුල්ල වෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2024**
**-----------------------------------------------------------------------------------------**

බදුල්ල වෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කල යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

ණය ගිවිසුම් අනුව, ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ.

පේරාදෙණිය-බදුල්ල -වෙන්කලාඩි මාර්ගය, බදුල්ල සිට වෙන්කලාඩි දක්වා කි.මී.146.5 ක් ප්‍රතිසංස්කරණය කිරීමෙන් ඌව පළාත සහ මධ්‍යම පළාත සමඟ නැගෙනහිර පළාතේ සම්බන්ධතාව වැඩිදියුණු කිරීම මඟින් කලාපයේ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සහ කලාපයේ ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සිවිල් වැඩ, ඉඩම් අත්පත් කර ගැනීම, උපදේශන සේවා සහ ව්‍යාපෘති කළමනාකරණය යන සංරචක 04 යටතේ ක්‍රියාත්මක වේ.

ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය රු.මිලියන 18,200 කට සමාන එ.ජ.ඩො. මිලියන 140 ක් වූ අතර ඉන් රු.මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඔපෙක් අරමුදල සහ රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යනය කිරීමට සංවර්ධනය සඳහා සෞදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ඉතිරි එ.ජ.ඩො. මිලියන 20 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වේ.
ව්‍යාපෘතිය 2017 ජනවාරි 12 දින එහි කටයුතු ආරම්භ කර 2021 ජුනි 30 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2027 දෙසැම්බර් 31 දින දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්වාගණනය කල මතය**

මාගේ වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්වාගණනය කල මතය සඳහා පදනම**

**මෙම වාර්තාවේ 2.1** ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර

වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | ගිණුම්කරණ අඩුපාඩු/විගණන නිරීක්ෂණය | වටිනාකම රු.මිලියන | කලමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 දිනට නිම කරන ලද මාර්ගවල පිරිවැය වූ රුපියල් මිලියන 15,228.77 ක | 15,228.77 | එකඟ වේ | නිම කරන ලද මාර්ග ප්‍රාග්ධනිත කිරීමට පියවර ගත යුතු අතර |

| | | | | |
|---|---|---|---|---|
| | වටිනාකම , කෙරී ගෙන යන වැඩ ගිණුමට මාරු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙරී ගෙන යන වැඩ ගිණුමේ ශේෂය එම ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. | | | නිසි භාරදීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කළ යුතුය. |
| (ආ) | ඉංජිනේරුවරයා විසින් සහතික කරන ලද වටිනාකම රු. මිලියන 140.33 ක් වූ අන්තර් ගෙවීම් සහතිකපත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 140.33 | එකඟ වේ | වගකීම් මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම රුපියල් මිලියන 470.55 ක් වූ හිඟ අන්තර් ගෙවීම් සහතිකපත් 06 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙරීගෙන යන වැඩ සහ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වටිනාකම සඳහා වන ප්‍රතිපාදන ඊට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | 470.55 | එකඟ වේ | මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 5 හි 43(අ) ඡේදයට අනුව, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කම් සහ බැරකම් මූල්‍ය තත්වය ප්‍රකාශ කිරීමේ අවසාන දිනට විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත් ඉහත ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුව ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය සඳහා විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම් ගිණුම්ගත කර නොතිබුණි. | - | මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද උපදෙස් ලිපිය මත පදනම්ව විදේශ ණය සම්බන්ධ විනිමය ගැලපීම් සිදු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කළ යුතුය. |
| (ඉ) | 2019 වර්ෂයේ සිට ණය සඳහා ගෙවන ලද පොලිය ඇමරිකානු ඩොලර් මිලියන 10 කට සමාන | 1,653.36 | එකඟ වේ | අදාළ තොරතුරු භාණ්ඩාගාරයෙන් ලබා ගත යුතු අතර පොලී |

| | | | | |
|---|---|---|---|---|
| | රුපියල් මිලියන 1,653.36 ක් වූ අතර එය 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙරීගෙන යන වැඩ ඊට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | | | ගාස්තු ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ ණය දීමේ නියෝජිතායතනය විසින් කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකුට ගෙවන ලද රුපියල් මිලියන 846.19 ක මුදලක් ගිණුම්ගත කර නොතිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල විදේශ ණය ප්‍රමාණය ඊට සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි. | 846.19 | එකඟ වේ | මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය ගණකාධිකාරීවරයා විසින් සහතික කළ යුතුය. |

2.2 **නීති,රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019. 9.3 වගන්තිය | ව්‍යාපෘතියේ මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි. | මැතිවරණ සහ පරිපාලන ප්‍රමාදයන් වැනි විවිධ හේතූන් මත කළමනාකරණ චක්‍රලේඛයට අනුව රැස්වීම් සංවිධානය කර නොමැත. | රැස්වීම් අදාළ චක්‍රලේඛවලට අනුකූලව පැවැත්විය යුතුය. |
| (ආ) | 2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක ඩීඑම්ඒ/01/2019. | ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටුව ස්ථාපිත කළ යුතු අතර අවම වශයෙන් වාර්ෂිකව රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ආරම්භයේ සිටම කිසිදු කමිටු රැස්වීමක් පවත්වා නොතිබුණි. | එකඟ වේ | රැස්වීම් අදාළ චක්‍රලේඛවලට අනුකූලව පැවැත්විය යුතුය. |

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

(i) (අ) මාර්ග පුනරුත්ථාපනය

| සංරචකය | ක්‍රියාකාරකම | 2024 දෙසැම්බර් 31 දිනට | | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාදය සඳහා හේතු |
|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්යසාධනය කි.මී. | ලඟාකරගත් කාර්යසාධනය කි.මී. | | |
| මහා මාර්ග | මාර්ග ප්‍රතිසංස්කරණය | 146.75 | 127.75 | දින 378 සිට දින 879 පරාසයක ප්‍රමාදයකින් කොන්ත්‍රාත්තු අවසන් කර තිබුණි. තවද, OFID 03 කොන්ත්‍රාත්තුව 3B සහ 3C ක ලෙස ඛණ්ඩනය කර 2023 සැප්තැම්බර් 30 වන දිනට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් 2024 දෙසැම්බර් 31 වන දින දක්වා සම්පූර්ණ නොකර අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇති අතර, පිළිවෙලින් දින 236 ක් සහ දින 280 ක් ප්‍රමාද වී තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්යසාධනය සහ දුර්වල පරිපාලනය . |

**කළමනාකණයේ අදහස් දැක්වීම** එකඟ වේ.

**විගණකගේ නිර්දේශය** ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර අයවැය සහ වගකීම් ඒ අනුව නියම කළ යුතුය.

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| (ආ) ව්‍යාපෘතියේ මුළු කාල පරිච්ඡේදයම ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය, අර්ධ වාර්ෂිකව ආදී වශයෙන් වගකීම් | එකඟ වේ | ව්‍යාපෘතිය සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර අනුමත කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නියම කරමින් මූල්‍ය හා භෞතික ඉලක්ක ඉස්මතු කර වෙන් කරන ලද සම්පත් කාල සීමාව තුළ භාවිතා කරමින් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ව්‍යාපෘතිය විසින් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ, ව්‍යාපෘති ඉතුරුම් භාවිතා කරමින් නව කොන්ත්‍රාත් පැකේජ ආරම්භ කිරීමට ව්‍යාපෘතිය යෝජනා කර තිබුණි. මේ යටතේ, ඉතුරුම් භාවිතා කරමින් රුපියල් මිලියන 4,677.47 ක වටිනාකමකින් යුත් කොන්ත්‍රාත් පැකේජ 04 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. සෞදි අරමුදල් (SFD) ඉතිරිකිරීම් යටතේ ආරම්භ කරන ලද පැකේජ දෙකක භෞතික ප්‍රගතියෙන් සියයට 86 ක් සහ සියයට 81 ක් පෙන්නුම් කර ඇති අතර 2024 දෙසැම්බර් 31 වන විටත් OFID ඉතිරිකිරීම් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ඉතිරි පැකේජ දෙක ආරම්භ කර නොතිබුණි. | එකඟ වේ | ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු අතර අයවැය සහ වගකීම් ඒ අනුව නියම කළ යුතුය. |

(ii) **ඉඩම් අත්පත් කරගැනීම**

| **සංරචකය** | **ක්‍රියාකාරකම** | **2024 දෙසැම්බර් 31 දිනට** | | **ප්‍රමාදය/විගණන නිරීක්ෂණය** | **ප්‍රමාදය සඳහා හේතු** |
|---|---|---|---|---|---|
| | | **අපේක්ෂිත භෞතික කාර්යසාධනය ඉඩම් කැබලි ගණන** | **ලඟාකරගත් කාර්යසාධනය ඉඩම් කැබලි ගණන** | | |
| ඉඩම් අත්පත් කරගැනීම | අයිතිය ලියාපදිංචි කිරීම | 2,201 | 821 | 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ඉඩම් කට්ටි 2,201 ක් සඳහා වන්දි මුදලක් ගෙවා තිබුණද, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තියට අනුව, සමාලෝචිත වර්ෂයේ ඉඩම් කට්ටි 821 ක් පමණක් මාර්ග | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ අකාර්යක්ෂමතාව |

| | |
|---|---|
| | සංවර්ධන අධිකාරියට පවරාගෙන තිබුණි. |

| | |
|---|---|
| **කළමනාකණයේ අදහස් දැක්වීම** | වන්දි ගෙවා ඇති මුළු ඉඩම් කැබලි 2,201 න් ඉඩම් ලියාපදිංචි කිරීම සිදු කළ යුත්තේ ඉඩම් කැබලි 1,532 ක් සඳහා පමණි. 2024 දෙසැම්බර් දිනට ඉඩම් කැබලි 821 ක ලියාපදිංචි කිරීම සම්පූර්ණ කර තිබූ අතර ඉතිරි ඉඩම් කැබලි 711 න් 119 ක ලියාපදිංචි කිරීම මේ වන විට සම්පූර්ණ කර ඇත. අනෙක් ඉඩම් සඳහා ලියාපදිංචි කිරීම සිදු කරමින් පවතී. |
| **විගණකගේ නිර්දේශය** | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලින් ඉඩම් අත්පත් කර ගැනීමේ සැලැස්මට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ප්‍රධාන ගිණුම්දීමේ නිලධාරියා විසින් වගකීම් නියම කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

(අ) ලුණුගල සිට බිබිල දක්වා (කි.මී. 171+800 කි.මී. 190 + 800) පැකේජය2017 ජුනි 12 දින රු. මිලියන 2,006.43 ක මුදලකට කොන්ත්‍රාත්කරු කේ.ඩී. ඊබට් සහ පුත්‍රයෝ හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගමට ප්‍රදානය කර තිබුණු අතර කොන්ත්‍රාත් කාලය මාස 30 කි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය සහ එකඟ වූ කාල රාමුව තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන් 2021 ජුනි 29 දින සේවායෝජකයා විසින් කොන්ත්‍රාත්තුව පවරා ගන්නා ලද අතර ඒ වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 60.32 ක් විය. තවද,එ් අවස්ථාවේදී ව්‍යාපෘතිය විසින් කොන්ත්‍රාත්කරුට රු. මිලියන 1,204.95 ක මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | කොන්ත්‍රාත්කරු සහ සේවායෝජකයා යන දෙදෙනාගේම එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය නීතිපති දෙපාර්තමේන්තුවේ මතය විමසා තිබුණද, FIDIC කොන්දේසිවල කොන්ත්‍රාත් පොදු කොන්දේසි 15 වගන්තිය ප්‍රකාරව 'එකඟතාවයෙන් අවසන් කිරීම' සඳහා ප්‍රතිපාදන සපයා නොමැති බව නිරීක්ෂණය විය. මේ අනුව, කොන්ත්‍රාත් කොන්දේසි 15 වගන්තිය ප්‍රකාරව සහ නීතිපතිවරයාගේ මතය අනුව කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | කොන්ත්‍රාත් කොන්දේසි වලින් බැහැරවීම පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතු අතරෙ ආයතන සංග්‍රහයේ II වගන්තියට අනුව වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ii) | ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 17 දිනැති නීතිපතිවරයාගේ ලිපියට අනුව, "මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පැහැදිලිව සඳහන් කර ඇති පරිදි, මාගේ | සමාජීය ගැටළු, මාර්ග භාවිතා කරන්නන් මුහුණ දෙන දුෂ්කරතා, ඔවුන්ගේ ආරක්ෂාව සහ අනෙකුත් පාඩු අවම කිරීමට ඇති එකම විසඳුම වන්නේ පාර්ශවයන් විසින් එකඟ වූ කොන්ත්‍රාත්තුව වසා දැමීමයි, මන්ද මෙම මාර්ග කොටස හැකි ඉක්මනින් අවසන් කළ යුතුය. | කොන්ත්‍රාත් කොන්දේසි වලින් බැහැරවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අදහස වනුයේ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව පැහැදිලිව උල්ලංඝනය කර ඇති අවස්ථාවක, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත්තුව අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීම සඳහා කිසිදු 'පරිපූරක ගිවිසුමකට' (Suplementary Agreement)එළඹිය යුතු නොමැති වන අතර කොන්ත්‍රාත් ගිවිසුම අවසන් කිරීමේදී, පාර්ශවයන් ආරම්භයේදී එකඟ වී ඇති පරිදි, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන තුළ ක්‍රියා කළ යුතුය" යනුවෙන් එහි සඳහන් විය. 2022 ජූලි 31 දිනෙන් අවසන් වන කාර්ය සාධන සහතිකයේ වලංගු කාලය අවසන් වීමට පෙර ඉංජිනේරුවරයා විසින් 2021 ජුනි 12 දින, අර්ධ වශයෙන් නිම කරන ලද වැඩ භාරගෙන තිබීම හේතුවෙන් , මාර්ග සංවර්ධන අධිකාරියට එහි පාඩුව අවම කර ගැනීමට තිබුණු හැකියාව අහිමි වී ඇති බව නිරීක්ෂණය විය. | | |
| (iii) | ඉහත පැකේජය කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ සිට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව දක්වා අධිකාරී මට්ටමින් පහත දමා, ඉතිරි කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල රු. මිලියන 2,919.56 ක් ලෙස පැකේජ දෙකක් ලෙස නැවත ලංසු කැඳවා තිබුණි. නීත්‍යානුකූල හේතූන් මත කොන්ත්‍රාත් ඛණ්ඩනය අවශ්‍ය යැයි සලකනු ලැබුවද, ප්‍රසම්පාදන අත්පොතේ 4.4.2 පරිච්ඡේදය අනුව ඛණ්ඩනයට පෙර එම ප්‍රසම්පාදනය සිදුකිරීමට නිසි බලය පැවරී තිබූ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතු වුවත් කොන්ත්‍රාත්තුව ඛණ්ඩනය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය නිම කිරීම සම්බන්ධයෙන් කාලය සහ ආර්ථික කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා, ප්‍රසම්පාදන මට්ටම කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ මට්ටමේ සිට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මට්ටම දක්වා අඩු කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් අනුමත කරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ කොන්දේසි වලින් බැහැරවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | විගණනයට සපයා ඇති තොරතුරුවලට අනුව, මූලික කොන්ත්‍රාත්තුව අවලංගු කරන තෙක් ඒ සඳහා දරන ලද වියදම රු. මිලියන 1,241.24 ක් වූ අතර මුළු කොන්ත්‍රාත්තුව නිම කිරීම සඳහා ඇස්තමේන්තු කර ඇති මුදල රු. මිලියන 2,006.43 සිට රු. මිලියන 4,160.80 දක්වා වැඩි විය. මේ අනුව, ඉතිරි වැඩ කොන්ත්‍රාත් පැකේජ දෙකක් ලෙස නැවත ප්‍රදානය කිරීම හේතුවෙන් මුළු කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 2,154 කින් වැඩි වී තිබුණි. එබැවින් ව්‍යාපෘති පිරිවැය සැලකිය යුතු ලෙස ඉක්මවා යාමට කොන්ත්‍රාත්තුවේ අසාමාන්‍ය ප්‍රමාදය සහ වැරදි කළමනාකරණය සෘජුවම බලපා තිබුණි. තවද, මෙම කරුණ සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 17 දිනැති අංක BCL/44/22/RDA දරන නීතිපතිවරයාගේ ලිපියෙන්ද අවධාරණය කර තිබුණි. තවද, OFID 03 පැකේජය භාරගැනීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ ඇති වූ ආරවුල 2024 දෙසැම්බර් 31 වන දින වන තෙක් විසඳා නොතිබූ අතර, එදිනට රු. මිලියන 35.57 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි. | නව කොන්ත්‍රාත් සඳහා ඉදිරිපත් කළ ලංසු මිල, පෙර කොන්ත්‍රාත්තුවේ වටිනාකමට වඩා වැඩි වූයේ, මුල් කොන්ත්‍රාත්තුවේදී කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ ලංසු අනුපාතය ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා ඉතා අඩු වූ බැවිනි.<br><br>තවද, භූමි තත්ත්වයන්හි වෙනස්කම්, බලපෑම් සහිත බාධා (enforceable disturbances) සහ රටේ ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රමාණවත් ලෙස ප්‍රමාණයන් වැඩිවීම සිදුවූ අතර, එය සියලු ද්‍රව්‍යවල මිල ඉහළ යාමට හේතු විය. | කොන්ත්‍රාත් මිල සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |

**(ආ) නායකඳුර ජල සම්පාදන ව්‍යාපෘතියේ ජලනල මාර්ග මාරු කිරීම**

බදුල්ල වෙන්කලඩි මාර්ගයේ යාල්කුඹුර සිට අක්කිරියන්කුඹුර දක්වා ජල නල මාරු කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් බිබිල ප්‍රාදේශීය සභාව වෙත මූලිකව රුපියල් මිලියන 142 ක මුදලක් ගෙවා තිබුණි. මෙම ගෙවීම 2015 දෙසැම්බර් 29 සහ 2016 සැප්තැම්බර් 21 යන දිනවල සමාන වාරික දෙකකින් සිදු කර තිබුණි. ජල නල මාරු කිරීමේ කටයුතු ප්‍රමාද වූ අතර මාර්ග කැණීම් මඟින් ,සේවා මාර්ගය (service corridor) ලබා දෙන තුරු බලා සිටීමට සිදු වී තිබුණි. 2021 වර්ෂයේදී මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්කරුගේ කටයුතු අවසන් කිරීම හේතුවෙන් මාර්ග කැණීම් කටයුතු ප්‍රමාද වී තිබුණි. ඉතිරි මාර්ග ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්තුව නැවත ප්‍රදානය කිරීමෙන් පසු, මිල ඉහළ යාම සහ මූලික විෂය පථයේ සිදු කරන ලද වෙනස්කම් හේතුවෙන් රු. මිලියන 52.88 ක අමතර මුදලක් ගෙවීම සඳහා 2023 ඔක්තෝබර් 30 වන දින තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව එම ගෙවීම් ප්‍රාදේශීය සභාවට 2023 සහ 2024 කාලය තුළ සිදු කර තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූලික විෂයපථය සහ සම්පූර්ණ කාර්ය හඳුනා නොගෙන , ගිවිසුමකට එළඹීමකින් සහ විධිමත් ගෙවීම් ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමකින් තොරව, ජල නල මාර්ග මාරු කිරීම සඳහා බිබිල ප්‍රාදේශීය සභාව වෙත රුපියල් මිලියන 194.88 ක මුළු මුදලම ගෙවා තිබුණි. තවද, කිසිදු ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකර බිබිල ප්‍රාදේශීය සභාව විසින් සපයන ලද ඇස්තමේන්තුව පදනම් කර වැඩවල පිරිවැය තීරණය කර තිබුණි. | **එකඟ වේ.** | ව්‍යාපෘතිය ඵලදායී කාල සැලැස්මක් සකස් කළ යුතු අතර අයවැය සහ වගකීම් ඒ අනුව නියම කළ යුතුය. |
| (ii) | 2016 වර්ෂයේදී මූලිකව රුපියල් මිලියන 142 ක ගෙවීම දී සිදු කර තිබුණු අතර, එම මුළු මුදල 2018 වර්ෂය අවසානය දක්වා ප්‍රාදේශීය සභවේ තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.එම නිසා එම මුදල තෙවන පාර්ශවයක් සතුව අනාර්ථිකව වසර දෙකකට වැඩි කාලයක් රඳවා ගෙන තිබුණි. | සිවිල් කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රමාදය හේතුවෙන් මාර්ග කොරිඩෝව සකස් කිරීම ප්‍රමාද වූ අතර, එම නිසා ජල නලමාරු කිරීම ද ප්‍රමාද විය. | අසාමාන්‍ය ගෙවීම් නිදහස් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. |
| (ඇ) | කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි 14.7(ආ) ඡේදය අනුව, එක් එක් අතුරු ගෙවීම් සහතිකයේහි සහතික කළ මුදල ඉංජිනේරුවරයාට, ප්‍රකාශන සහ උපකාරක ලියකියවිලි ලැබී දින 90ක් ඇතුළත ගෙවිය යුතුය. ඉහත පරිදි කොන්ත්‍රාත්කරුට ගෙවීම් නොලැබුනේ නම්, ප්‍රමාද කාලය තුළ නොගෙවූ මුදල සඳහා මූල්‍ය ගාස්තු ලබා ගැනීමට කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇත. OFID/04 සහ OFID/03B කොන්ත්‍රාත්වල කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ප්‍රමාද පොලිය ලෙස රුපියල් මිලියන 2.18 ක මුදලක් ඉංජිනේරුවරයා විසින් සහතික කර ඇති බව නිරීක්ෂණය විය අතර. ගෙවීම් සහතිකයන් සඳහා වන සම්පූර්ණ ගෙවීම් ක්‍රියාවලියේ | **එකඟ වේ.** | ප්‍රමාද පොලිය ගෙවීම වළක්වා ගැනීමට පියවර ගත යුතු අතර, සම්පූර්ණ ගෙවීම් ක්‍රියාවලියේ එක් එක් පියවර සඳහා කාල පරාසයන් වෙන් කිරීමෙන් ඵලදායී කාල සැලැස්මක් සකස් කිරීම සඳහා වගකීම් නියම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එක් එක් පියවර සඳහා කාල පරාසයන් වෙන් කරමින් කාර්යක්ෂම කාල සැලැස්මක් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන නොතිබුණි. බැවින්, ඉංජිනේරුවරයා විසින් අතුරු ගෙවීම් සහතිකයන්, සහතික කිරීමේ සඳහා දින 20 සිට 44 දක්වා කාලයක් වැය කර විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇති බව නිරීක්ෂණය විය. තවද, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දින 23 සිට 90 දක්වා කාලයක් ගත කර තිබුණි. | | |
| (ඇ) | පිළිගත හැකි හේතූන් මත වැඩ නිම කිරීම සඳහා කොන්ත්‍රාත්කරුට කාල දිගුවන් ඉල්ලුම් කිරිරමට (EOT) හිමිකම් ඇත. | | |
| (i) | කොන්ත්‍රාත්කරු විසින් මුල් ගිවිසුම් කාලය අවසන් වීමට පෙර හෝ පෙර අනුමත කළ කාල දිගු (EOT) දිනයට පෙර කාල දිගුවක් ලබා ගැනීම (EOT )සඳහා අයදුම් කළ යුතු වුවත්, 2024 වසර තුළද කාල දිගුවෙන් ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත් 04ක් දින 18 සිට දින 254 දක්වා වූ ප්‍රමාදයන් සමඟ කාල දිගු කිරීම (EOT) සඳහා අයදුම් කර ඇති බව නිරීක්ෂණය විය. | කිසියම් හිමිකම් පෑමක් ප්‍රමාද වුවහොත් කොන්ත්‍රාත්කරු ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. ඉංජිනේරුවරයාගේ නිර්දේශය අනුව සේවායෝජකයා විසින් කාල දිගුවෙන් (EOT) අනුමත කර ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(c) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාලෝචනය සිදු කරන විට විශේෂ අවධානය යොමු කළ යුතු අතර ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |
| (ii) | කාල දිගු ලබාදීම, (EOT) මුල් ගිවිසුම් කාලය අවසන් වීමට පෙර හෝ පෙර අනුමත කළ කාල දිගුවේ කාලය (EOT) අවසන් වීමට පෙර අනුමත කළ යුතු වුවත්, සමාලෝචිත වසර තුළද ක්‍රියාත්මක වූ කොන්ත්‍රාත් 04 ක් සඳහා සභාපතිවරයා විසින් කාලය දීර්ඝ කිරීම් (EOT) අනුමත කිරීම දින 89 සිට දින 324 දක්වා වූ ප්‍රමාදයකින් සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය | කිසියම් හිමිකම් පෑමක් ප්‍රමාද වුවහොත් කොන්ත්‍රාත්කරු ඉංජිනේරුවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. ඉංජිනේරුවරයාගේ නිර්දේශය අනුව සේවායෝජකයා කාල දිගර්ඝ කිරීම් (EOT) අනුමත කර ඇත | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(c) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාලෝචනය සිදු කරන විට විශේෂ අවධානය යොමු කළ යුතු අතර ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය. |

### 3.3 ඉඩම් අත්පත් කර ගැනීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 38(අ) වගන්ති යටතේ ඉඩම් කැබලි 5530ක් අත්පත් කර ගෙන තිබුණද, 2024 වර්ෂය අවසන් වන විටත් ඉඩම් කැබලි 10ක් සඳහා තක්සේරු වාර්තා ලබාගෙන නොතිබුණි. | මෙම ඉඩම් කැබලි වල අයිතිය ප්‍රාදේශීය ලේකම්වරයා විසින් හඳුනාගෙන නොමැති වීම නිසා තක්සේරු කිරීම සඳහා විස්තර යවා නොමැත. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලීන් ඉඩම් අත්පත් කර ගැනීමේ සැලැස්මට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගකීම් නියම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ඉඩම් කැබලි 5530න් 2201ක් සඳහා පමණක් රුපියල් මිලියන 600.56ක වන්දි මුදලක් ගෙවා තිබූ අතර, එය සමස්ථ වන්දි ගෙවීමේ ක්‍රියාවලියේ සියයට 40ක් පමණක් නියෝජනය කර තිබුණි. | පස්සර සහ ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් මුළු ඉඩම් කට්ටි 706ක් සඳහා වන්දි මුදල්, බදුල්ල දිස්ත්‍රික් අධිකරණයේ තැන්පත් කිරීමට නියමිතයව තිබේ. දැනට මෙම ක්‍රියාවලිය සිදුවෙමින් පවතීයි. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලීන් ඉඩම් අත්පත් කර ගැනීමේ සැලැස්මට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගකීම් නියම කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වන්දි ගෙවීම් ප්‍රමාද වීම හේතුවෙන්, ඉඩම් කැබලි 953ක් සඳහා රුපියල් මිලියන 166.83ක පොලි මුදලක් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය (PMU) විසින් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. තවද, 2024 දෙසැම්බර් 31 වන දිනට අනුව ඉඩම් කැබලි 1,459ක් සඳහා ගෙවිය යුතු ප්‍රමාද පොලිය ලෙස රුපියල්. මිලියන 72.2ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. | අධිකරණ කටයුතු සඳහා යොමු කරන ලද ඉඩම් කැබලි සඳහා ප්‍රමාද පොලිය ලෙස ඇස්තමේන්තු කර ඇති මුදල, නාමික වටිනාකම යටතේ හෝ සම්පූර්ණ මුදල ලෙස ගැනේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලීන් ඉඩම් අත්පත් කර ගැනීමේ සැලැස්මට අනුකූලව ක්‍රියාත්මක වන බව සහතික කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වගකීම් නියම කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිසි දත්ත සමුදායක් පවත්වා ගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය වූ අතර, එම නිසා, ව්‍යාපෘතිය මගින් අත්පත් කරගත් ඉඩම්වල ප්‍රමාණය විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සපයනු ලබන තොරතුරු වලට අනුව, ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට අදාළ සියලු දත්ත ව්‍යාපෘතිය තුළ නිසි ලෙස යාවත්කාලීන කර ඇත. | නිසි දත්ත සමුදායක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |

**3.4 ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව, සමාලෝචිත වර්ෂය සඳහා රුපියල් මිලියන 6,072ක මුදලක් වෙන් කර තිබුණි. එහෙත්, ව්‍යාපෘතිය විසින් රුපියල් මිලියන 3,177.52ක් පමණක් උපයෝජනය කර තිබූ අතර, එය සමාලෝචිත තුළ වෙන් කළ මුළු මුදලෙන් සියයට 52.33ක් නියෝජනය කර තිබුණි. | බෑවුම් දේශගුණයට ඔරොත්තු දීමේ (Slope Climate Resilience) ව්‍යාපෘතියට සහ රන්දෙනිගල මාර්ගය අංශයට වෙන් කර ඇති ව්‍යාපෘති මුදල් ඉතිරි වී තිබුණත්, 2024 වසර තුළ මෙම ව්‍යාපෘති දෙකම ආරම්භ කිරීමට නොහැකි වූ බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති අරමුදල් ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |